මෛත්‍රීපාල සිරිසේන
Maithripala Sirisena
හයවන විධායක ජනාධිපති
The 6th Executive President

2026 ඔක්තෝම්බර් මස 19 වන දින.

## ප්‍රවෘත්ති නිවේදනයයි!

පූජ්‍ය ගලබොඩඅත්තේ ඥාණසාර හිමි නැවත බන්ධනාගාර ගත කිරීමේදී එම නඩු තීන්දුව දුන් ගරු අධිකරණයේ තීන්දු ප්‍රකාශයේ සටහන් වී ඇත්තේ උන්වහන්සේ නිදහස් කිරීමට ගරු අධිකරණයට සිදුවූ කරුණු අතර ජනාධිපති කාර්යාලයෙන් ගරු අධිකරණයට ඉදිරිපත් කළ ලිපි ලේඛන වල තාක්ෂණික දෝෂයක් සිදුවී ඇති බවයි.

ගරු අධිකරණයේ තීරණය නිවරදි අතර එම තීන්දුවට මා ගරු කරමි.

මෙම වූදිත පූජ්‍ය ගලබොඩඅත්තේ ඥාණසාර හිමියන්ට විරුද්ධව නඩු දෙකක් තිබී ඇත. එහි අංක සඳහන් කරන්නේ නම්,
01 - හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයේ
B 7417/10 නඩුව අනුව අධිකරණයට බාධා කිරීමත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 ව්‍යවස්ථාව යටතේ අධිකරණයට අපහාස කිරීම.
02 - හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයේ 40042 නඩුව

ඉහත නඩු දෙකම පූජ්‍ය ගලබොඩඅත්තේ ඥාණසාර හිමියන්ට සමාවදීම සඳහා අධිකරණ හා බන්ධනාගාර අමාත්‍යාංශයට යවා අනුමැතිය ගත යුතු බව මාගේ ජනාධිපති කාර්යාලයේ සේවය කළ නීති අංශය භාර අතිරේක ජ්‍යෝෂ්ඨ ලේකම්වරිය මාවෙත දන්වා සිටියද අදාළ එම ඉල්ලීම අධිකරණ හා බන්ධනාගාර අමාත්‍යාංශයට යවා නැත. ඒ අනුව ඉහත කී අමාත්‍යාංශයේ අනුමැතිය නොමැතිව මාගේ අත්සන පමණක් ලබාගෙන ඇත. එය මා නොමග යැවීමකි.

ඉහත හේතු මත පාක්‍යසෝති සරවනමුත්තු මහතාගේ රාජ්‍ය නොවන සංවිධානයක් මගින් සන්ධ්‍යා එක්නැලිගොඩ මහත්මිය පැමිණිල්ලක් කර අධිකරණයට ඉදිරිපත් කර ඇති නඩුවක් මගින් මෙම තීරණය ලැබී ඇත. මම ජනාධිපතිධූරය දරණ කාලයේ මාගේ නීති අංශය භාර අතිරේක ජ්‍යෝෂ්ඨ ලේකම්වරිය මගින් සිදුවී ඇති වරද අනුව පූජ්‍ය ගලබොඩඅත්තේ ඥාණසාර හිමිට නැවත වරක් සිරගත වීමට සිදුවී ඇත.

මෙම සිද්ධිය මාගේ නිලධාරීන් එවකට සිදුකළත් ගෞරවනීය මහා සංඝරත්නයගෙන් සිදුවී ඇති වරදට මා සමාව ඉල්ලා සිටිමි.

මෙම තොරතුරු මා විසින් අන්තර්ජාලයෙන් ලබාගත් අධිකරණ තීන්දුවේ පිටපතක් අධ්‍යයනය කිරීමෙන් පසු බව කාරුණිකව දන්වා සිටිමි.

රටේ ගෞරවනීය මහා සංඝරත්නය, මාධ්‍යවේදීන් සහ බොහෝ පිරිස් මාගෙන් මෙම නඩුවේ තාක්ෂණික දෝෂය කුමක්ද යන්න මාගෙන් විමසන බැවින් මෙම නිවේදනය නිකුත් කිරීමට සිදුවූ බව කෘතඥතා පූර්වකව දන්වා සිටිමි.

ස්තූතියි.

**මෛත්‍රීපාල සිරිසේන**
හය වන විධායක ජනාධිපති.

i. අංක 61, මහගමසේකර මාවත, කොළඹ 07
No: 61,Mahagamasekara Road, Colombo 07
T: +94 112 081 225/6 Fax: +94 112

@maithripalas
@maithripalaS

Email: info@maithripalasirisena.lk
Web: www.maithripalasirisena.lk

ii. නව නගරය පාර, පොළොන්නරුව
New Town, Polonnaruwa
T: +94 272 223 126 Fax: +94 272 227 540